සහනාධාර චක්‍රලේඛ අංක : 67

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
2008.12.01 දින.

242

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්

**කුඩා තේ වතු නැවත වගා බිම් ප්‍රමාණය වැඩිකිරීම්**

චක්‍රලේඛ පරමාර්ථ

(අ) කුඩා තේ වතු අංශයේ ඵලදායීතාවය වර්ධනය කිරීම උදෙසා වාර්ෂික නැවත වගා බිම් ප්‍රමාණයේ ප්‍රතිශතය 1.5% ක් දක්වා වැඩිකිරීම .

(ආ) දිරි දීමනා ක්‍රමය යටතේ තේ නැවත වගා බිම් සීමාව හෙක්ටයාරය දක්වා වැඩිකිරීම .

**හැඳින්වීම:**

කුඩා තේ වතු අංශයේ නැවත වගා කළයුතු බිම් ප්‍රමාණය 2005 සංගණන වාර්තාව පරිදි වගාවේ වයස් කාණ්ඩ අනුව සංගණනය සිදු කරන අවස්ථාව වනවිටද හෙක්ටයාර 23,000 ක් පමණවේ. දැනට තේ නැවත වගාවට යොමුවන ප්‍රමාණය දළ වශයෙන් 1% වඩා අඩු ප්‍රතිශතයක් වන බැවින් නැවත වගාව උක්ත ඉඩම් ප්‍රමාණයේ සම්පූර්ණ කිරීම සඳහා වසර 23 ක් වත් ගතවේ. ඉදිරි වසර 10 තුළ නැවත වගාවට එළඹෙන බිම් ප්‍රමාණය ගණන් ගැනීමේදී එය තවදුරටත් ඉහළ අගයක් ගනී. තවද වාර්ෂිකව හෙක්ටයාර 2300 ක් නැවත වගාවට යොමුකලහොත් අපේක්ෂිත ඉඩම් ප්‍රමාණය නැවත වගා කිරීමට වසර 10 ක පමණ කාලයක් ගතවේ. එබැවින් පවත්නා මූල්‍ය තත්ත්වය තුළ වාර්ෂිකව හෙක්ටයාර් 1500 ක් නැවත වගාවට යොමු කිරීමට අපේක්ෂිතව ඇත.

**බිම් සීමාව:**

ඉහත අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම උදෙසා වගා දිරි දිමනා ක්‍රමය යටතේ දැනටමත් අක්කරයක් සඳහා ගෙවීම් කරනු ලබන බිම් ප්‍රමාණය ඉදිරියටද යටත් පිරිසෙයින් 70% ක ප්‍රතිශතයක් දක්වා ක්‍රියාත්මක කෙරෙමින් ඉතිරි 30% ක ප්‍රතිශතය තුළ හෙක්ටයාර් 1 දක්වා වූ උපරිම බිම් ප්‍රමාණයක් සඳහා අවසර පත්‍ර ලබාදීම අනුමත කරනු ලැබේ.

**සුදුසු ඉඩම් තේරීමේ ක්‍රියාව**

අධිකාරිය සතු සංගණන ලේඛණ, ඉඩම් ලේඛන පාදකව සහ ව්‍යාප්ති ක්‍රමවේද අනුගමනය කරමින් නැවත වගාව සඳහා සුදුසු ඉඩම් තෝරාගත යුතුය. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ පහසුව සඳහා ග්‍රාමසේවා වසම්/ගම් අනුව වගාකරුවන් තෝරා ගැනීම වඩාත් පහසු වනු ඇත.

එක් එක් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශයක නැවත තේ වගාව සඳහා අවසර පත් නිකුත් කරන බිම් ප්‍රමාණයෙන් 70% ක ප්‍රමාණයක් අක්කරය දක්වා වූ ඉඩම් කට්ටි විය යුතු අතර, හෙක්ටයාරය දක්වා අනුමත කරන බිම් ප්‍රමාණය 30% ක ප්‍රතිශතය නොඉක්මවිය යුතුය. මෙහිදී අක්කරයකට අඩු ඉඩම් හිමියන් සඳහා ප්‍රමුඛත්වය හිමි විය යුතුය

**ක්‍රියාත්මක කිරීම:**

පරීක්ෂණ පැවැත්වීම හා වාර්තා කිරීම සඳහා අධිකාරිය මගින් මෙතෙක් ක්‍රියාත්මක වූ ක්‍රමවේදයම අනුගමනය කරමින් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකළ යුතුය.

**පස සාරවත් කිරීම**

නිර්දේශිත පරිදි තෘණ වගාව පිහිටුවා නඩත්තු කරමින් පාංශු පුනරුත්ථාපන කටයුතු මගින් උපරිම කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයක් පසට එක් කිරීම ඉතා වැදගත් හා වඩාත් අවධානය යොමු කළයුතු කාර්යයක් ලෙස සැලකිය යුතුය. මෙහිදී තෘණ සිටුවීමත් සමගම කාබනික පොහොර නිෂ්පාදනය සඳහා වගාකරුවන් දැනුවත් කළ යුතුය.

මෙම වැඩසටහන 2009 වසරේ සිට ක්‍රියාත්මක වන බැවින් ඔබගේ ක්‍රියාකාරී සැලැස්ම පාදකව දැන් සිටම මේ සඳහා අවශ්‍ය ඉඩම් තෝරා ගෙන නැවත වගා ඉලක්කයන් සැපිරීම සඳහා අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කළ යුතුය . මේ පිළිබඳ ඔබගේ සියලු කාර්යමණ්ඩල දැනුවත් කිරීමට කටයුතු කළයුතු අතර මේ සමග අමුණා ඇති දැන්වීම දැන්වීම් පුවරුවල ප්‍රදර්ශණය කර තැබිය යුතුය.

1/12/08

එස්.ඩී.නන්දසේන
සාමාන්‍යාධිකාරී.

පිටපත:

1. සභාපති
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(ව්‍යාප්ති)
3. අභ්‍යන්තර විගණක
4. මුදල් කළමනාකරු
5. කෘෂි අර්ථශාස්ත්‍රඥ
6. සහකාර ප්‍රජා සංවර්ධන කළමනාකරු
7. සියළුම මාණ්ඩලික නිලධාරීන්
8. ගරු සභාපති/ගරු ලේකම් - සමස්ත ලංකා සමිති සංවිධානය.